# ආර්ථික විද්‍යාව

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

# 12. ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය සහ ප්‍රතිපත්ති

## බහුවරණ ප්‍රශ්න

අංක 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර** තෝරන්න.

1. ශ්‍රී ලංකාවට ආනයන ආදේශන කාර්මීකරණ ප්‍රතිපත්ති , අපනයන විවිධාංගීකරණය, විනිමය අනුපාත ප්‍රතිසංස්කරණය යනාදිය ආරම්භ වූ අවධිය වනුයේ,
   (1) 1948 – 1960 අවධිය
   (2) 1961 – 1977 අවධිය
   (3) 1978 – 1994 අවධිය
   (4) 1994 – 2015 අවධිය
   (5) 2015 - පසු අවධිය

2. අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය යනු,
   (1) සුඛෝපභෝගී හා අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය සීමා කිරීමයි.
   (2) අපනයන භාණ්ඩ සීමා කිරීම හා ගෙවුම් ශේෂ ගැටළු සඳහා විසඳුම් සෙවීමයි.
   (3) දේශීය වශයෙන් නිපදවන භාණ්ඩ අපනයනය කිරීමයි.
   (4) තරඟකාරී ලෙස විදේශ වෙළෙඳපොළ ඉලක්ක කර ගනිමින් භාණ්ඩ නිෂ්පාදනය සිදු කිරීමයි.
   (5) ආනයන හා අපනයන සඳහා විදේශ වෙළෙඳපොළ විවෘත කිරීම.

3. විදේශ විනිමය රට තුළට ගලා එන පරිදි පැවති විනිමය අනුපාතය 100% ක් අවප්‍රමාණය හා විදේශ විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් ලිහිල් කිරීම පහත කවර ප්‍රතිපත්තියෙහි ලක්ෂණ වේද?
   (1) ආනයන ආදේශන කාර්මීකරණ ප්‍රතිපත්තිය
   (2) අපනයන අභිමුඛ කාර්මීකරණ ප්‍රතිපත්තිය
   (3) විනිමය පාලන ප්‍රතිපත්තිය
   (4) අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්තිය
   (5) දරිද්‍රතාව අවම කිරීමේ ප්‍රතිපත්තිය

4. ආනයන ආදේශන කාර්මීකරණ ප්‍රතිපත්තියට සෘජුවම අදාළ නොවන ක්‍රියාමාර්ගයක් වනුයේ,
   (1) බෙහෙත්, රෙදිපිළි වැනි පාරිභෝගික භාණ්ඩ දේශීයව නිපදවීම සඳහා දිරි ගැන්වීමයි.
   (2) විදේශ රටවලින් ආනයනය කරන සමහර භාණ්ඩ සීමා කිරීමයි.
   (3) ආනයනය කරන භාණ්ඩවල දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමයි.
   (4) අපනයන විවිධාංගීකරණය මගින් ලෝක වෙළෙඳපොළ කොටස පුළුල් කිරීමයි.
   (5) දේශීය නිෂ්පාදනය හා අභ්‍යන්තර හුවමාරු කිරීම් මගින් වෙළෙඳපොළ අතරමැදියන් ලබන වාසි සීමා කිරීමයි.

5. 1977 න් පසු ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ අපනයන අභිමුඛ කාර්මික ප්‍රතිපත්තියේ ඉලක්කයක් වනුයේ,
   (1) විදේශ වෙළෙඳපොලට නිපදවන භාණ්ඩ අඩු කිරීමයි.
   (2) අපනයන තරඟකාරීත්වය හා අපනයන විවිධාංගීකරණය මඟින් ලෝක වෙළෙඳපොළ තුල සිය කොටස පුළුල් කර ගැනීමයි.
   (3) ආනයන සීමා කිරීමයි.
   (4) විදේශ ආයෝජන සීමා කිරීමයි.
   (5) ආනයන ආදේශන කර්මාන්ත පුළුල් කිරීමයි.

6. 2022 වර්ෂය වන විට කෘෂි, කාර්මික, සේවා අංශ වල දායකත්වයේ ප්‍රතිශතයන් සඳහා අදාළ නිවැරදි පිළිතුර වන්නේ,

| | කෘෂි අංශයේ දායකත්වය | කාර්මික අංශයේ දායකත්වය | සේවා අංශයේ දායකත්වය |
|---|---|---|---|
| (1) | 19.9 | 52.8 | 40 |
| (2) | 8.5 | 54.6 | 44 |
| (3) | 8.1 | 56.3 | 44 |
| (4) | 7.5 | 27.5 | 60.5 |
| (5) | 3.2 | 22.5 | 50.2 |

7. ආර්ථික යටිතල පහසුකම් සඳහා උදාහරණයක් වනුයේ,
   (1) රෝහල්
   (2) ප්‍රජා සේවය
   (3) වාරි මාර්ග
   (4) ජල සම්පාදනය
   (5) නිවාස

8. සමාජ යටිතල පහසුකම් සඳහා උදාහරණයක් වනුයේ,
   (1) දුම්රිය මාර්ග
   (2) පාලම්
   (3) ගුවන් තොටුපොළ
   (4) ප්‍රවාහන පද්ධති
   (5) ජල සම්පාදනය

9. යටිතල පහසුකම් වර්ධනය වීම තුළින් ආර්ථිකයට ලබා ගත හැකි වැදගත්කමක් නොවනුයේ ,
   (1) ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට ඇති හැකියාව ඉහළ යාමය .
   (2) නිෂ්පාදකයින්ගේ පිරිවැය අඩු වීමය.
   (3) කළමණාකරණය හා සම්බන්ධීකරණ කටයුතු කාර්යක්ෂම වීමය.
   (4) අපතේ යාම් හා නාස්ති වීම් ඉහළ යාමය.
   (5) ආර්ථික වෘද්ධිය වේගවත් වීමය.

10. 2021 වර්ෂයට අදාළව ශ්‍රී ලංකාවේ සෞභාග්‍යතා දර්ශකය වන්නේ මින් කවරක්ද?
    (1) 0.796
    (2) 0.254
    (3) 0.524
    (4) .0325
    (5) 0.842

11. 2020 වසරේ ශ්‍රී ලංකාවේ මුළු රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වෙන වඩාත් නිවැරදි පිළිතුර වනුයේ කුමක්ද?
    (1) 78.3%
    (2) 144.2%
    (3) 84.1%
    (4) 86.2%
    (5) 100.6%

12. උපායමාර්ගික වශයෙන් ශ්‍රී ලංකාව වැදගත් ආර්ථික මධ්‍යස්ථානයක් බවට පත් කිරීමේ අරමුණ ඇතිව 2006 – 2016 කාලය තුළ හඳුන්වා දුන් “ෂඩ් කේන්ද්‍රීය” වැඩසටහන අදාළ නොවන කේන්ද්‍රයක් වනුයේ මින් කවර පිළිතුරක්ද?
    (1) ගුවන්
    (2) යටිතල පහසුකම්
    (3) වාණිජ හා සංචාරක
    (4) සමුද්‍රීය
    (5) දැනුම් හා බලශක්ති

13. ගෝලීය ශ්‍රේණිගත කිරීම් අනුව ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකය 2020 වසරේදී ශ්‍රී ලංකාව ලබා ඇති ස්ථානය වන්නේ කුමක්ද?
    (1) රටවල් 184 ක් අතරින් 98 ස්ථානය
    (2) රටවල් 190 ක් අතරින් 99 ස්ථානය
    (3) රටවල් 190 ක් අතරින් 98 ස්ථානය
    (4) රටවල් 141 ක් අතරින් 84 ස්ථානය
    (5) රටවල් 180 ක් අතරින් 94 ස්ථානය

14. අභ්‍යන්තර සමතුලිතතාව යනුවෙන් හැඳින්වෙනුයේ,
    (1) පූර්ණ සේවා නියුක්තිය හා මිල ස්ථායීතාව යන ගැටෙන අරමුණු තුලනය කර ගැනීම වේ.
    (2) ආහාර වර්ධන හා පාරිසරික සුරක්ෂිතතාව යන ගැටෙන අරමුණු තුලනය කර ගැනීම වේ.
    (3) මිල ස්ථායීතාව, ආදායම් ව්‍යාප්තියේ සාධාරණත්වය හා ගෙවුම් ශේෂය ශක්තිමත් කර ගැනීම පතා ගැටෙන අරමුණු තුලනය කර ගැනීම වේ.
    (4) තීරණ ගැනීමේදී ආර්ථික ,සමාජයීය හා පාරිසරික යන පැතිකඩ තුලනය කර ගැනීම වේ.
    (5) තිරසාර ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය, ඌණ සේවා නියුක්තිය, මිල ස්ථායිතාව හා ආදායම් ව්‍යාප්තියේ සාධාරණත්වය යන ගැටෙන අරමුණු තුලනය කර ගැනීම වේ.

15. දැනුම පදනම් කර ගත් ආර්ථිකයේ වැදගත් සංකල්පයක් නොවන්නේ, පහත පිළිතුරු අතුරින් කුමක්ද?
    (1) දැනුම්කරුවන්
    (2) බුද්ධිමය දේපොළ
    (3) බුද්ධිමය ප්‍රාග්ධනය
    (4) පාරම්පරික දැනුම
    (5) දැනුම් ඉංජිනේරුවන්

16. නිර්බාධකරණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට ජාත්‍යන්තර මූල්‍ය ආයතන සංවර්ධනය වෙමින් පවතින රටවලට නිර්දේශ කරන ලද ප්‍රතිපත්ති වන්නේ,
    (1) විවෘත ආර්ථික ප්‍රතිපත්ති වේ.
    (2) විනිමය අනුපාත ප්‍රතිපත්ති වේ.
    (3) ව්‍යුහාත්මක ගැලපුම් ප්‍රතිපත්ති වේ.
    (4) නව ලිබරල්වාදී ප්‍රතිපත්ති වේ.
    (5) රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය වේ.

17. චීනය විසින් ක්‍රියාත්මක කරන තීරුවක් හා මාවතක් (Belt and road) නැතහොත් සේද මාවත වැඩසටහන යටතේ දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති දෙකක් වන්නේ මින් කවරක්ද?
    (1) කොළඹ වරාය දකුණු ජැටිය හා හම්බන්තොට වරාය ඉදි කිරීම.
    (2) මත්තල ගුවන් තොටුපළ හා කොළඹ වරාය නගරය ඉදි කිරීම.
    (3) හම්බන්තොට වරාය සංවර්ධන හා කොළඹ වරාය නගරය ඉදිකිරීම.
    (4) මධ්‍යම අධිවේගී මාර්ගය හා සබරගමුව අධිවේගී නගරය ඉදි කිරීම.
    (5) කොළඹ වරාය හා මත්තල ගුවන්තොටුපළ සංවර්ධනය

18. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග 3ක් සඳහන් වන පිළිතුර වන්නේ, කුමක්ද?
    (1) සංචාරකයින්ගේ අපේක්ෂිත වර්ධනයට සමගාමීව හෝටල් කාමර ප්‍රමාණවත් නොවීම, පුහුණු ශ්‍රමිකයින්ගේ හිඟ බව, නොවිධිමත් අංශය තුළ සංචාරක කර්මාන්තයේ ආරක්ෂාව, ගෝලීය වසංගත තත්වය
    (2) හෝටල් කාමර ප්‍රමාණවත් නොවීම , ජාතිවාදී ගැටළු, යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම.
    (3) චීනයෙන් පැමිණෙන සංචාරකයින් වැඩි වීම සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධ ආයතන මන්දගාමී වීම, දූර්වල යටිතල පහසුකම්.
    (4) ගෝලීය වසංගත තත්වය, ගෝලීය ත්‍රස්තවාදය, ගෝලීය ආර්ථික අර්බුදය
    (5) ශ්‍රී ලංකාවේ නිතර නිතර ආණ්ඩු මාරු වීම, ගෝලීය වසංගත තත්වය, දූර්වල යටිතල පහසුකම්

19. 2020 වර්ෂයට අදාළව ආංශික සේවා නියුක්ති අනුපාතිකයන් සඳහන් නිවැරදි පිළිතුර වන්නේ,

| | කෘෂි අංශය | කාර්මික අංශය | සේවා අංශය |
|---|---|---|---|
| (1) | 27.6 | 47.1 | 25.3 |
| (2) | 27.6 | 24.1 | 50.1 |
| (3) | 27.1 | 26.9 | 46.0 |
| (4) | 25.3 | 27.6 | 47.1 |
| (5) | 25.3 | 49.2 | 27.1 |

20. 2021 වසර අගභාගයේ 2016 වර්ෂයට පසු විදේශ රැකියා සඳහා සේවා නියුක්තිය 126.8% ක ඉහළ අගයක් වාර්තා වුණි. මේ සඳහා බලපෑ හේතුවක් වනුයේ,
   (1) ශ්‍රමය ලබා ගන්නා රටවල් ගෝලීය වසංගතයට මුහුණ නොදීමය .
   (2) ශ්‍රමය ලබා ගන්නා රටවල රැකියා අවස්ථා ඉහළ යාම සහ සංචරණ සීමා ලිහිල් කිරීමය.
   (3) ශ්‍රමය ලබා ගන්නා රටවල කඩිනම් පුද්ගල එන්නත්කරණයය.
   (4) විදේශගත වන ශ්‍රමිකයින්ගේ ඵලදායීතාව ඉහළ යාමය.
   (5) ශ්‍රමය ලබා ගන්නා රටවල පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟ බවය.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

## ආර්ථික විද්‍යාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
## සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 12. ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය සහ ප්‍රතිපත්ති

**බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු**

| | |
|---|---|
| 1. | (2) |
| 2. | (4) |
| 3. | (2) |
| 4. | (4) |
| 5. | (2) |
| 6. | (4) |
| 7. | (3) |
| 8. | (5) |
| 9. | (4) |
| 10. | (1) |
| 11. | (5) |
| 12. | (2) |
| 13. | (2) |
| 14. | (5) |
| 15. | (4) |
| 16. | (3) |
| 17. | (1) |
| 18. | (1) |
| 19. | (3) |
| 20. | (2) |

# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
# සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 12. ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය සහ ප්‍රතිපත්ති
## ව්‍යුහගත ප්‍රශ්න

**සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1.
   (i) අපනයන අභිමුඛ කාර්මික ප්‍රතිපත්තියේ ඉලක්ක මොනවාද?
   (ii) ශ්‍රී ලංකාවේ ආනයන ආදේශන කාර්මීකරණ උපායමාර්ග අසාර්ථක බව පෙන්නුම් කර ඇත. එයට බලපෑ හේතු සඳහන් කරන්න.
   (iii) 1977 – 2005 වර්ෂයේදී ක්‍රියාවට නැංවූ නිර්බාධකරණය ආර්ථික ප්‍රතිපත්තිය යනු කුමක්ද? ඒ සඳහා යොදා ගත් මූලික අංග කීපයක් සඳහන් කරන්න.
   (iv) නිර්බාධකරණයේ ආර්ථික ප්‍රතිවිපාක මොනවාද?

2.
   (i) ආර්ථික යටිතල පහසුකම් හඳුන්වා , යටිතල පහසුකම් උදාහරණයක් සහිතව වර්ග කර දක්වන්න.
   (ii) ආර්ථිකයක් සඳහා යටිතල පහසුකම් වල වැදගත්කම් සඳහන් කරන්න.
   (iii) ශ්‍රී ලංකා ආර්ථිකයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රජය මෙතෙක් ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද?
   (iv) රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? එහි වැදගත්කම සඳහන් කරන්න.

3.
   (i) ශ්‍රී ලංකාවේ 1977 සහ 2020 වසර වල දළ දේශීය නිෂ්පාදනය සඳහා කෘෂි , කාර්මික හා සේවා අංශයන් සඳහා දායකත්වයන් සන්සන්දනය කරන්න.
   (ii) 2020 වසර වන විට නිෂ්පාදන ව්‍යුහයේ ප්‍රධාන අංශ වන කෘෂි , කාර්මික හා සේවා අංශයන් සඳහා ඉහළ දායකත්වයන් සපයා ඇති ප්‍රධාන සංරචකය ප්‍රමාණාත්මකව දක්වන්න.
   (iii) 2016 සිට 2020 තෙක් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතයන් සඳහන් කර, ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය පහළ යාමට බලපා ඇති හේතු සඳහන් කරන්න.
   (iv) ශ්‍රී ලංකාවේ කෘෂි , කාර්මික හා සේවා අංශයන්ගේ වර්ධනය සඳහා මෙතෙක් ගෙන ඇති ක්‍රියා මාර්ග මොනවාද?

4.

(i) විදේශ සේවා නියුක්තිය හා විදේශ ප්‍රේෂණ මගින් ආර්ථිකයට ලබා දෙන ප්‍රතිලාභ සඳහන් කරන්න.

(ii) විදේශ සේවා නියුක්තිය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා රජය මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

(iii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

(iv) ආර්ථිකයේ ප්‍රාදේශීය විෂමතා ඇති වීම කෙරෙහි බලපාන සාධක හා එහි වැදගත්කම් මොනවාද?

5.

(i) ශ්‍රී ලංකා ආර්ථිකයට මෙතෙක් මුහුණ දීමට සිදුවී ඇති දේශීය හා ගෝලීය සිදු වීම් මොනවාද?

(ii) දේශීය හා ගෝලීය සිදුවීම් ආර්ථිකයට ප්‍රබල බලපෑම් එල්ල කරයි. එම සිදු වීම් ඍජුව හෝ වක්‍රව ආර්ථිකයේ කුමන සාර්ව ආර්ථික විචල්‍යයන් සඳහා බලපෑම් එල්ල වේද?

(iii) දැනුම් ආර්ථිකය පිළිබඳ දර්ශකය සකස් කිරීමට යොදා ගන්නා නිර්ණායක මොනවාද?

(iv) දැනුම් ආර්ථික කරා ශ්‍රී ලංකාව ගෙන යාමේ අභියෝග සඳහන් කරන්න.

# ආර්ථික විද්‍යාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 12. ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය සහ ප්‍රතිපත්ති

### ව්‍යුහගත ප්‍රශ්න සඳහා පිළිතුරු

1.

(i) -අපනයන තරඟකාරිත්වය හා අපනයන විවිධාංගීකරණය මගින් ලෝක වෙළෙඳපොල තුල පුළුල් කොටසක් අත්පත් කර ගැනීම.

- -ගෙවුම් ශේෂ ගැටළු විසඳා ගැනීම
- -විදේශ විනිමය ගැටළු අඩු කර ගැනීම
- -විදේශ ආයෝජන පුළුල් කර ගැනීම
- -සේවා නියුක්තිය ඉහළ දැමීම.

(ii) -රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණයේ පැවති අඩුපාඩු හේතුවෙන් ආනයන ආදේශන කර්මාන්ත අකාර්යක්ෂම බවට පත්වී රාජ්‍ය වියදම් ඉහළ යාම.

- -කර්මාන්තවල නිෂ්පාදන කටයුතු සඳහා ඉහළ ප්‍රාග්ධන සූක්ෂම ක්‍රම භාවිතය හේතුවෙන්, සේවා නියුක්ති අවස්ථා අඩු වීම.
- -අවශ්‍ය නිමැවුම් මට්ටමට ළඟා වීමට අවශ්‍ය සම්පත් ලබා ගැනීමේ දුෂ්කරතා පැවතීම.
- -භාණ්ඩවල ගුණාත්මක බවේ අඩුකම හා පිරිවැය ඉහළ යාම.
- -තීරණ ගැනීමේදී නිලධාරිවාදය ක්‍රියාත්මක වීම.

(iii) ශ්‍රී ලංකාවේ 1977 කාලය දක්වා පැවති අභ්‍යන්තරාව ලෝග්‍ය ආර්ථික ප්‍රතිපත්ති වෙනුවට විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීම සිදු විය. එවිට රාජ්‍ය ප්‍රතිපත්ති යටතේ රාජ්‍ය කාර්යභාරය සීමා වූ අතර විදේශ වෙළෙඳාම හා සම්බන්ධව පැවති සීමාවන් ඉවත් කෙරුනි.

- ඒ සඳහා විදේශ වෙළෙඳාමේ නීතිරීති සංරෝධක ලිහිල් කිරීම දැඩි පාලනය යටතේ පැවති ආනයන වෙළෙඳාම වෙනුවට සරල තීරු බදු ක්‍රමයක් යටතට ගෙන ඒම.
- ස්ථාවර හා බහුවිධ විනිමය අනුපාතය වෙනුවට නම්‍ය විනිමය අනුපාත ප්‍රතිපත්තියක් හඳුන්වා දීම.
- ආර්ථික කටයුතු සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීම අඩුකොට පෞද්ගලික අංශයට ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම.
- බදු සහන , බදු විරාම ලබා දීම.
- නිර්බාධකරණ ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව විසින් පූර්ණ අනුග්‍රහය රජයට ලබා දීම.

(iv) -පාවෙන පාලිත විනිමය අනුපාත ක්‍රමයක් බිහිවීම.

ඒ අනුව 46%කින් ඩොලරයට සාපේක්ෂව විනිමය අනුපාතය අවප්‍රමාණය කරන ලදී.

-1978 – 1982 අතර කාලය තුල ප්‍රසංසනීය ලෙස ආර්ථික වෘද්ධිය ඉහළ යාම හා ව්‍යුහාත්මක පරිවර්තනයක් ඇති වීම.(2.9% සිට 6% දක්වා)

-ආයෝජන අනුපාතය 1977 – 1982 කාලය තුළ 16% -30% දක්වා වර්ධනය විය.

-සේවා නියුක්තිය ඉහළ යාම.

-1985 වන විට කාර්මික අපනයන 40% දක්වා ද 1995 වන විට 75% දක්වා ද ඉහළ යන ලදී.

-ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අපනයන මත රඳා පැවති ප්‍රමාණය පහළ යාම.

2.

(i) ආර්ථිකයක නිෂ්පාදන හා හුවමාරු ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම හා ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීමට නැතහොත් පහසු කිරීමට උපකාර වන ප්‍රාග්ධනය යටිතල පහසුකම් වශයෙන් හඳුන්වයි.

-යටිතල පහසුකම් කොටස් 2ක් යටතේ වර්ග කළ හැක.

- ආර්ථික යටිතල පහසුකම් - මහාමාර්ග , වරාය
- සමාජ යටිතල පහසුකම් - පාසැල් , රෝහල්

(ii) - ඵලදායිතාව ඉහළ යාම.

-ආර්ථික වෘද්ධිය වේගවත් වීම.

-ආයෝජන ඉහළ නංවා ගැනීමට උපකාරී වීම.

-කළමනාකරණය හා සම්බන්ධීකරණය කාර්යක්ෂම වීම.

-නිෂ්පාදකයන්ගේ පිරිවැය අඩු වීම.

-ජනතාවගේ ජීවන තත්වය වැඩි දියුණු වීම.

(iii) - රජයේ දස අවුරුදු දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුව

-යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පුද්ගලික අංශයේ දායකත්වය ලබා ගැනීම. (B,O,T)

උදා-:හම්බන්තොට වරාය සංකීර්ණය

කෙරවලපිටිය ගල්අඟුරු බලාගාරය

මහ කොළඹ ජල ප්‍රවාහන පද්ධතිය

රන්දොර ජාතික යටිතල පහසුකම් සංවර්ධන ප්‍රවේශය

(iv) රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය යන දෙපාර්ශවයම එක් වී තමන්ට වඩාත් හොඳින් කළ හැකි කාර්යයන් සඳහා ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමවේ.
-රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වයේ වැදගත්කම් වනුයේ

- මෙවැනි ව්‍යාපෘති වලදී කාර්යක්ෂමතාව ඉහළ බැවින් රාජ්‍ය මූල්‍යයට වාසිදායකවේ.ඒ තුලින් අයවැය හිඟය අඩු කර ගැනීමට හැකියාව ලබා ගත හැක.
- ව්‍යාපෘති කල්තබා නිම කිරීම වෙනුවෙන් ප්‍රසාද දීමනා ලබා දෙන විට ඒවායෙහි කාර්යක්ෂමතාව ඉහළ යයි.
- ව්‍යාපෘති මෙහෙයවීමේදී හා ක්‍රියාවට නැංවීමේදී දැරිය යුතු අවදානම් පෞද්ගලික අංශයට පැවරීමේ හැකියාව ලැබේ. (පිරිවැය පාලනය කිරීමේ අත්දැකීම් හා පළපුරුද්ද ඇති)
- ව්‍යාපෘති සඳහා නව්‍ය ක්‍රමවේද යොදා ගැනීමට අවස්ථාව සැලසේ.
- ව්‍යාපෘති නිම කිරීමේ කාලය වේගවත් කර ගැනීමේ හැකියාව ලැබේ.
- පෞද්ගලික අංශයේ සහාය හේතුවෙන් රජයේ අරමුදල් වඩා කාර්යක්ෂම ලෙස වැය කිරීමට ඉඩ ලැබේ.
- රාජ්‍ය වියදම් පහළ යන බැවින් ජනතාව මත පතිත වන ඉහළ බදුබර අඩු විය හැක.

3.

(i)

| වර්ෂය | **2020** |
|---|---|
| කෘෂි අංශය | 7.0 |
| කාර්මික අංශය | 25.5 |
| සේවා අංශය | 58.7 |

- ශ්‍රී ලංකාවේ 1977 වන විට කෘෂි අංශයේ දළ දේශීය නිෂ්පාදිත දායකත්වය ඉහළම අගයක් ලබා දුන් අතර එය 31.9 ක් පමණ වූ අතර 2020 වන විට 7.0% දක්වා අඩු වීමක් පෙන්නුම් කරයි.
- කාර්මික අංශයේ දායකත්වය 2020 වන විට 25.5% දක්වා වර්ධනය වී ඇති අතර 1977 වර්ෂ වලදී 14% පමණ විය.
- සේවා අංශය 1977 වර්ෂය වන විට දායකත්වය 41% පමණ වූ අතර එය 2020 වන විට 58.7% ක් දක්වා ඉහළ අගයක් පෙන්නුම් කරයි.

ඉහත සංඛ්‍යා දත්ත සැසඳීමෙන් පෙනී යන ප්‍රධාන කරුණ වනුයේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ දායකත්වය ඉතා පහළ අගයකට පත් වී ඇති බවයි. එමෙන්ම කාර්මික අංශයේ දායකත්වය ඉහළ ගොස් ඇති බව පැහැදිලිවේ.

(ii) - කෘෂිකාර්මික අංශයේ දායකත්වය 7.0 වන අතර ඒ තුල ඉහල දායකත්වය ධීවර කර්මාන්තය -1.0 කි.

කර්මාන්ත අංශයේ දායකත්වය 25.5 වන අතර ඒ තුල ඉහල දායකත්වය නිෂ්පාදන කර්මාන්ත -15.5 කි.

-සේවා අංශයේ ඉහළ දායකත්වය 58.7 වන අතර ඒ තුල ඉහල දායකත්වය වෙළෙඳාම , ප්‍රවාහන සේවාවන් , නවාතැන් සැපයීම හා ආහාර පාන සැපයීමේ සේවාවන් - 22.7% කි.

(iii)

| වර්ෂය | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|
| ආර්ථික වර්ධන අනුපාතය | 4.5 | 3.6 | 3.3 | 2.3 | -3.6 |

වර්ධන අනුපාතය පහළ යාමට බලපා ඇති හේතු වනුයේ,

- ආර්ථිකයේ පැවති උද්ධමන තත්වය
- 2019 වසරේ පැවති පාස්කු ප්‍රහාර වල බලපෑම්
- විරැකියා අනුපාතය ඉහළ යාම. (2009 ට පසු 5.5% දක්වා ඉහළ යාම)

- කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් නිෂ්පාදන මට්ටම් පහළ යාම, එනම් ඉදි කිරීම්, ප්‍රවාහන, සංචාරක ව්‍යාපාර අඛණ්ඩව පවත්වා ගැනීමේ නොහැකියාව මෙයට බලපෑ ප්‍රධාන හේතුවක් විය.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ පාර්ශවකාර රටවල ඇති වූ අහිතකර තත්වයන්

**(iv)** **කෘෂි අංශය වර්ධනය සඳහා**

- කෘෂිකාර්මික නවීකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කෘෂි වාරි සංවර්ධන වැඩසටහන් පළාත් 6ක් තුල ක්‍රියාවට නැංවීම.
- කෘෂි නිෂ්පාදන ආරක්ෂා කිරීමට උෂ්ණත්වය පාලනය කල හැකි ගබඩා සංකීර්ණ ස්ථානගත කිරීම.
- කෘෂි උවදුරු සඳහා (අවදානම්) මුහුණ දීමේ හැකියාව වැඩි දියුණු කිරීම.

**කාර්මික අංශයේ වර්ධනය සඳහා**

- අධි යන්ත්‍ර සූත්‍ර ආනයනය වෙනුවෙන් පනවා තිබූ වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බද්දෙන් 75% සහනයක් ලබා දීම.
- අපනයන සැකසුම් කලාප සංවර්ධනය
- විශේෂ කාර්මික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**සේවා අංශයේ වර්ධනය සඳහා**

- මූල්‍ය සේවා කටයුතු වල ඉහළ වර්ධනය
- තොග හා සිල්ලර වෙළෙඳාම ඉහළ යාම.
- සංචාරක කර්මාන්තය හේතුවෙන් නවාතැන් හා ආහාර සැපයීම් සේවා ඉහළ යාම.

4.

(i). - ආර්ථිකයේ විරැකියා අනුපාතය පහළ දැමිය හැකි වීම.
-පුද්ගලයින්ගේ ආදායම් ඉහළ යාම.
-දරිද්‍රතාව පහළ යාමට ඉවහල් වීම.
-විදේශ ඉපයීම් වර්ධනය වීම.
-ගෙවුම් ශේෂ ගැටළු වලට ප්‍රබල විසඳුමක් වීම.
-විදේශ වත්කම් ඉහළ යාම.
-මුදලේ විදේශ අගය ශක්තිමත් වීම.

(ii). -ශ්‍රම සංක්‍රමණික සේවකයින් හා ඔවුන්ගේ පවුල් සවිබල ගැන්වීම සඳහා ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
-නීති විරෝධී ලෙස විදේශ රැකියා වෙත යොමු කරන්නන් වෙනුවෙන් නීති ක්‍රියාත්මක කිරීම.
-සංක්‍රමණිකයන් වෙනුවෙන් රක්ෂණ ආවරණ ක්‍රියාත්මක කිරීම.
-සංක්‍රමණික සේවකයින්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීම.
-විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් සෑම පළාතකම සංක්‍රමණික මධ්‍යස්ථාන පිහිටු වීම.

(iii) - 2017 – 2020 සඳහා නව සංචාරක උපාය මාර්ග සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
-ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
-අන්තර්ජාලය පදනම් කරගත් ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම.
-නව ජීවිතාරක්ෂණ ඒකක පිහිටුවීම.
-නව ගුවන් සේවා, මඟී නෞකා සේවා ක්‍රියාත්මක කිරීම.
-ජාත්‍යන්තර සම්බන්ධතා වැඩි දියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
-ජංගම සංචාරක පොලිස් කොට්ඨාශ පිහිටුවීම.

(iv) ආර්ථිකය තුල අඩු සංවර්ධනයක් සහිත ප්‍රදේශ සංවර්ධනය සඳහා සහාය ලබා දීම ප්‍රාදේශීය සංවර්ධනය වශයෙන් හඳුන්වයි. ප්‍රාදේශීය වශයෙන් ගන්නා ක්‍රියාමාර්ග හා ඉලක්ක එකිනෙකට වෙනස්වේ.

- ආර්ථිකයේ ප්‍රාදේශීය වශයෙන් විෂමතා ඇති වීමට බලපාන සාධක වනුයේ,
  - දියුණු තාක්ෂණ ක්‍රම භාවිතා නොකිරීම.
  - නිලධාරිවාදය (රාජ්‍ය)
  - දේශපාලන අස්ථාවරබව
  - වෘත්තීමය දැනුම හා පුහුණුව ලබා ගැනීමේ ඇති දුෂ්කරතා
  - පාරිසරික හේතු
  - දේශපාලන පක්ෂපාතී බව

-ප්‍රාදේශීය සංවර්ධනයේ වැදගත්කම් වනුයේ ,

- යටිතල පහසුකම් ඉහළ යාම.
- සේවා නියුක්තිය ඉහළ යාම.
- දේශීය නිෂ්පාදිතය ඉහළ යාම.
- නවෝත්පාදන දිරිගැන්වීම.
- කුඩා කර්මාන්ත සංවර්ධනය
- ව්‍යවසායකයන් දිරිමත් වීම.
- ජීවන තත්වය ඉහළ යාමට ඉවහල් වීම.

5.

(i) ශ්‍රී ලංකා ආර්ථිකයට මෙතෙක් මුහුණ පෑමට සිදුවී ඇති දේශීය සිදුවීම් වන්නේ

-පාස්කු ප්‍රහාරය
-2004 වසරේ සුනාමි තත්වය
-ගංවතුර හා නාය යෑම්
-වරින්වර ඇති වූ නියඟ තත්වයන්
-කෘමි උවදුරු (සේනා දළඹු වසංගතය)
-වන සතුන්ගෙන් සිදු වන හානි
-කොවිඩ් වසංගතය
-දේශපාලන ගැටළු

ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑ ගෝලීය සිදුවීම්

-ආසියාතික මූල්‍ය අර්බුදය
-යුරෝපා ආර්ථික අර්බුදය
-ගෝලීය ආර්ථිකයේ රටවල් අතර ඇතිවූ අර්බුද
-ලෝක ආහාර අර්බුදය
-විවිධ කලාපවල ඇති වූ ස්වභාවික උපද්‍රව
-ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම.

(ii) බලපෑම් එල්ල කරන සාර්ව ආර්ථික විචල්‍යයන් වනුයේ,

සමස්ත නිෂ්පාදනය, සේවා නියුක්තිය, පොදු මිල මට්ටම, පොළී අනුපාතය, ගෙවුම් ශේෂය, විදේශ විනිමය අනුපාතය, අන්තර්ජාතික වෙළෙඳාම, සංචාරක ව්‍යාපාරය

(iii) - ආර්ථික සානුබලය හා ආයතනික ව්‍යුහය
-නව්‍යතාවයන් හා තාක්ෂණ උපයෝගී කර ගැනීමේ නැඹුරුව
-අධ්‍යාපනය හා පුහුණුව
-ICT යටිතල පහසුකම්

(iv) -ශ්‍රී ලංකාවේ ආර්ථික වෘද්ධි අනුපාතය පහළ මට්ටමක පැවතීම.
-මේ හේතුව නිසා අධ්‍යාපන මට්ටම, මානව ප්‍රාග්ධන සමුච්චනය පහළ මට්ටමක පවතී.
-පර්යේෂණ හා සංවර්ධනය උදෙසා වැය කරන අරමුදල් පහළ අගයක් ගැනීම.
-ඍජු ආයෝජන අඩු තාක්ෂණයක් සහිත කර්මාන්ත වෙත වැඩි ගලා ඒමක් පැවතීම හේතුවෙන් මානව ප්‍රාග්ධන සම්පාදනය අඩු වීම.
-අඩු නිපුණතා සහ අඩු වැටුප් පදනම් කරගත් කාර්මීකරණ ක්‍රියාවලිය නිසා දැනුම් ආර්ථික කේන්ද්‍රීය ආර්ථික වෘද්ධිය කරා නැඹුරුව අඩුවේ.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

A/L NOTE BOOK
All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

↓

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."